# අසංතතික දැනුම

මනස විසින් බොහෝ දැනුම් නිපදවුව ද එම දැනුම් අසංතතික වෙයි. දැනුම අසංතතික ය යන්නෙන් කියැවෙන්නේ මනසට ඕනෑ ම දැනුමක් නිමවිය නොහැකි බවයි. මෙම අසංතතික-භාවයේ ස්වභාවය පුද්ගලයා ගෙන් පුද්ගලයාට වෙනස් විය හැකි වුව ද එහි සියලු පුද්ගලයන්ට පොදුබවක් ද තිබෙනවා විය හැකි ය. එක් පුද්ගලයකුට නිපදවිය හැකි එහෙත් තවත් කෙනකුට නිපදවිය නොහැකි දැනුම් තිබේ. එමෙන් ම කිසි ම කෙනකුට නිපදවිය නොහැකි දැනුම් ද තිබේ. පුද්ගලයකුට නිමවිය නොහැකි දැනුම් තිබේ නම්, ඒ අනුව එම පුද්ගලයා දැනට නිමවාගෙන සිටින දැනුමේ සිට ඊළඟට යා හැකි එකිනෙකින් වෙන් වූ දැනුම හෙවත් දැනුම් අවස්ථා සැලකිය හැකි ය. මේ සෑම දැනුම් අවස්ථාවක් ම ඒ පුද්ගලයා ගේ ලෝකය බවට පත් විය හැකි ලෝක නිරූපණය කරයි. ඊළඟට යා හැකි දැනුම් අවස්ථා විශාල ප්‍රමාණයක් තිබිය හැකි වුව ද ඒ සීමිත ගණනාවකි. එහෙත් එම අවස්ථා අසංතතික ය. එනම් එම පුද්ගලයාට යා නොහැකි දැනුම් අවස්ථා ද තිබේ. එමෙන් ම ඇතැම් පුද්ගලයන්ට තම ජීවිත කාලය පුරාවට ම කිසියම් දැනුම් අවස්ථාවකින් ඔබ්බට යා නොහැකි වනවා ද විය හැකි ය.

පුද්ගලයකුට සාපේක්ෂව සැලකූ කල එම පුද්ගලයාට දැනට සිටින දැනුම් අවස්ථාවේ සිට යා හැකි දැනුම් අවස්ථා තවත් පුද්ගලයකුට යා හැකි දැනුම් අවස්ථාවලින් වෙනස් ය. එමෙන් ම එක් දැනුම් අවස්ථාවක සිටින විට ඊට සාපේක්ෂව ඇති (එනම් එහි සිට යා හැකි) දැනුම් අවස්ථාවලට වඩා වෙනස් දැනුම් අවස්ථා මුල් දැනුම් අවස්ථාවේ සිට වෙනත් දැනුම් අවස්ථාවකට ගිය විට ඇති වනවා විය හැකි ය. එනම් එක් දැනුම් අවස්ථාවක සිට යා හැකි අවස්ථා එම දැනුම් අවස්ථාවට සාපේක්ෂ වෙයි. ඒ අනුව පුද්ගලයකුට දැන් සිටින දැනුම් අවස්ථාවේ සිට යා හැකි දැනුම් අවස්ථා පුද්ගලයා මතත් දැනට සිටින දැනුම් අවස්ථා මතත් රඳා පවතින බව කිව හැකි ය. (මෙම දැනුම් අවස්ථා සහ අදාළ පුද්ගලයා ගේ චින්තනය අතර සම්බන්ධයක් ඇති බව අමුතුවෙන් කිව යුතු නො වේ.) මේ සියලු වෙනස්කම් මැද වුව ද දැනුමේ ඇති අසංතතිකබවේ මිනිසුන් සමූහයකට අදාළ ව පොදු බවක් ද දැකිය හැකි ය. කිසිදු මිනිසෙකුට නිමවිය නොහැකි දැනුම ඇත්තේ එබැවිනි. මෙම පොදු ලක්ෂණ අවසාන වශයෙන් වාස්තවික යථාර්ථය පිළිබඳ විශ්වාසය තහවුරු වීමට හේතු වන බව පෙනේ.

දැනුම් අසංතතික නම් එක් දැනුම් අවස්ථාවක සිට තවත් දැනුම් අවස්ථාවකට යාමට අවශ්‍ය අවම දැනුම ප්‍රමාණයක් නැත හොත් අවධි දැනුම ප්‍රමාණයක් තිබෙනවා යැයි සැලකිය හැකි ය. මෙම අවධි දැනුම් ප්‍රමාණය නිර්ණය වීමට අල්ලාගෙන ඇති දැනුම අතහැරීමට ඇති නොහැකියාව ද බලපායි. පුද්ගලයකු ගේ අවබෝධය වෙනස් වීමට එනම් එක් දැනුම් අවස්ථාවක සිට තවත් දැනුම් අවස්ථාවකට යාමට එම අවධි දැනුම් ප්‍රමාණය එම පුද්ගලයාට නිපදවා ගැනීමට සිදු වේ. එම අවධි දැනුම් ප්‍රමාණය නොමැති නම් එම පුද්ගලයාට දැනට සිටින දැනුම් අවස්ථාවේ ම සිටීමට සිදු වෙයි. දැනුම බාහිරින් ලැබිණැයි කිව හැකි වුව ද බාහිරින් ලැබෙන දැනුම වුව ද අවසානයේ දී අදාළ පුද්ගලයා ගේ නිර්මාණයක් බවට ම පත් වෙයි.

දැනුම් අවස්ථා පුද්ගලයා ගෙන් පුද්ගලයාට වෙනස් වුව ද එම දැනුම් අවස්ථාවල ඇති පොදුබව නිසා පුද්ගලයන් සමූහයකට එකිනෙකට ආසන්න දැනුම් අවස්ථාවල පිහිටිය හැකි වෙයි. මෙවැනි අවස්ථාවක දී වාස්තවික යථාර්ථයක් ඇති බවක් හැඟෙනවා විය හැකි ය. පුද්ගලයකුට යා නොහැකි දැනුම් අවස්ථා තිබීමේත්, (එනම් ඇතැම් ආකාරවල දැනුම් අවස්ථා නො තිබීමේත්) ඇතැම් දැනුම් අවස්ථාවලට අදාළ ව පුද්ගලයන් සමූහයක් සඳහා පොදු බවක් නො තිබීමේත් ප්‍රතිඵලය වනුයේ, පුද්ගලයන් පිරිසකට, ආසන්න වශයෙන් සමාන දැනුම් අවස්ථාවක සිට, සමූහයක් ලෙස යා හැකි, තවත් ආසන්න වශයෙන් සමාන දැනුම් අවස්ථා ප්‍රමාණය සීමිත වන බවයි. පුද්ගලයන් සමූහයක ගේ දැනුම ආසන්න වශයෙන් සාමූහිකව වෙනස් වීමේ දී (කිරීමේ දී) එක් සාමූහික වශයෙන් පොදු අවස්ථාවක සිට තවත් සාමූහික ලෙස පොදු අවස්ථාවකට යාම සඳහා තිබිය යුතු අවම නැති නම් අවධි දැනුම් ප්‍රමාණයක් වෙයි. මෙම අවධි දැනුම ප්‍රමාණය නිර්ණය වීමේ දී අල්ලාගෙන ඇති දැනුම අතහැරීමට ඇති නොකැමැත්ත මෙන් ම සාමූහිකව පොදු දැනුමක් අල්ලා ගැනීමට ඇති කැමැත්ත බලපායි. (දැනුමේ වාස්තවිකත්වය පිළිබඳව ඇති විශ්වාසයට මුල් වන්නේ ඇතැම් දේ පිළිබඳව ඇති සාමූහික පිළිගැනීමයි. එහෙත් ඇතැම් කාරණාවල දී සාමූහිකව යම් මතයක් දැරීමට මනසේ ඇති නැඹුරුව යථාර්ථවාදීහු නො සලකා හරිති.) සාමූහික ව පොදු දැනුමක් දැරීමට අකැමැති අය ද සිටින බව ඇත්තකි.

එහෙත් පුද්ගලයන් ගේ දැනුම සාමූහිකව වෙනස් කිරීමේ දී වැදගත් වන්නේ එවැනි පුද්ගලයන් නො වේ. මෙම අවධි දැනුම් ප්‍රමාණය පුද්ගලයන් සමූහයකට ලබා දිය හැකි නම් එනම් එම පුද්ගලයන්ට එම දැනුම නිර්මාණය කරගත හැකි නම් සමූහයේ ම දැනුම වෙනස් කළ හැකි වෙයි.

ඇතැම් දැනුම් සමාජයේ ශීඝ්‍රයෙන් පැතිරෙයි. බුදු දහම අප රටේ ශීඝ්‍රයෙන් පැතිරුණු බව කියැවේ. ශීඝ්‍රයෙන් නො පැතිරුණ ද බොහෝ දෙනා පිළිගන්නා එනම් නිර්මාණය කර ගෙන සිටින දැනුම් තිබේ. දෙවියන් පිළිබඳ විශ්වාසය එවැන්නකි. පුද්ගලයන් ගේ දැනුම තනි තනි වත් සාමූහික වත් වෙනස් වන ආකාරය තේරුම් ගැනීමේ දී අසංතතික දැනුම් අවස්ථා පිළිබඳ දැනුම ඉවහල් වෙයි. එමෙන් ම පුද්ගලයකුට ගත හැකි කුඩා ම කාලය, කුඩා ම අවකාශය, කුඩා ම චිත්තය ආදිය පැවතීමට ද දැනුමේ අසංතතිකබව හේතු වෙයි.

**කථිකාචාර්ය නාරද වික්‍රමගේ**